# රාෂ්ට්‍ර පාලනාක්ෂිය ලෙස කෞටිල්‍යාක්ෂිය දුටු චරපුරුෂයා

නාකුළුගමුවේ සුමනරතන හිමි[1]

රාෂ්ට්‍ර පාලනයෙහි නියුතු රජ තෙමේ අධිකාරී පදවිවලට ඇමැතිවරුන් පත් කොට මන්ත්‍රීන්ගේ හා පුරෝහිතයාගේ යහපත් අයහපත් අදහස් ගුප්තාකාරයෙන් විමසිය යුත්තේ ය. එහි දී රජුගේ අක්ෂිය බවට පත් වන්නේ චරපුරුෂයා බව "ගාවෝ ගන්ධේන පශ්‍යන්ති වෙදේ පශ්‍යන්ති වෛද්විජාඃ චාරෛඃ පශ්‍යන්ති රාජානශ්චක්ෂ්‍යාං ඉතරේ ජනාඃ" (දෙන ගන්ධයෙන් ඉව කර බලයි; බමුණා ශාස්ත්‍රවලින් දකියි; රජු චරපුරුෂයන් මඟින් දකියි. සාමාන්‍ය ජනයා ඇස්වලින් දකියි) යනුවෙන් කෞටිල්‍යය දක්වයි. එමෙන් ම රජතුමා රාත්‍රියේ පළමු වැනි යාමයේ රහසිගත ව චරපුරුෂයන් මුණ ගැසී එහි සප්තම යාමයේ එනම් අලුයම ඔවුන් තත් ස්ථාන ගත කළ යුතු බව ඔහු දක්වයි. වර්තමාන ලෝකයේ රාෂ්ට්‍ර පාලනය සඳහා බුද්ධි අංශ, රහස් ඔත්තු සේවා, රහසිගත මෙහෙයුම් (CID) වැනි සංකල්ප ගොඩනැඟීමේ මූල බීජය ලෙස කෞටිල්‍යයගේ මේ අදහස දැක්විය හැකි ය. කාපටික, උදාස්ථිත, ගෘහපතික, වෛදේහක, තාපස, ස්ත්‍රී, තීක්ෂණ, රසද, භික්ෂුකී යනුවෙන් නව වැදෑරුම් චරපුරුෂයන් දක්වන කෞටිල්‍යය ඒ අතරට භික්ෂුකී ශබ්දය එක් කිරීමෙන් පරිව්‍රාජිකාවන් වැනි ස්ත්‍රීන් පවා චරපුරුෂ සේවයේ යෙදිය යුතු බව දක්වා තිබේ. ඔහුගේ විෂ කන්‍යා සංකල්පය මෙකල මරාගෙන මැරෙන කාන්තාවන් හෙවත් සියදිවි හානි කරගනිමින් සතුරා විනාශ කිරීමට පැමිණෙන ස්වයං ඝාතක කාන්තා චරිත මඟින් අනාවරණය වේ. මීට අමතර ව බැලූ බැල්මට බිහිරන් මෝඩයන් මෙන් පෙනෙන තැනැත්තන් හා නළුවන් චරපුරුෂයන් ලෙස යැවිය යුතු බව කෞටිල්‍යය දක්වයි. එවැනි චරිත ලෙස වෙස් වලාගෙන නූතන ලෝකයේ සිදු කරන අතිසාර්ථක රහස් මෙහෙයුම් රාශියක් ඇමරිකාව ඉරාකය වැනි රටවල භාවිත කරන රාෂ්ට්‍ර පාලන ක්‍රමවේදවලින් පෙනේ. එනිසා මේ සියල්ලෙහි මූලය කෞටිල්‍යගේ සංවිධානාත්මක විධිමත් චරපුරුෂ සංකල්පයේ විකාශනයක් නො වේ ද යන්න විමසා බැලීම කාලෝචිත වේ.

**ප්‍රමුඛ පදඃ** කෞටිල්‍ය, රාෂ්ට්‍ර පාලනය, චරපුරුෂයෝ, රහස් මෙහෙයුම්

[1] සංස්කෘත අධ්‍යනාංශය